කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

නීති පීඨය

නීතිවේදී උපාධි පරීක්ෂණය, සිව්වන වසර - 2020

**සමාගම් නීතිය**

**පැ තුනයි**

ඕනෑම ප්‍රශ්න **හතරකට (04)** පමණක් පිළිතුරු ලියන්න.

මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න **හතකින් (07)** සමන්විත වන අතර පිටු **පහක (05)** මුද්‍රණය කර ඇත.

නොපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කෙරේ.

---

1. Covid-19 ව්‍යාප්තියෙහි ප්‍රතිඵලයක් ලෙස බොහෝ ව්‍යාපාර වැසී ගොස් ඇත. මෙම ගෝලීය වසංගතය හේතුවෙන් සමාගම් බංකොලොත් භාවයෙන් තොරව පවත්වාගෙනයාම සම්බන්ධයෙන්, මෙම තත්ත්වය සැලකිය යුතු අභියෝග රැසක් ඇති කොට තිබේ. එබැවින් ව්‍යාපාර පුනර්ජීවනය කොට ඒවා ලාභ ඉපයීමේ මාර්ගය කරා නැවත ගැනීම සමාගම් සතු වත්මන් හා වැදගත් කාර්යයන් වේ.

2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සමාගම් සම්බන්ධයෙන් පවතින සාංගමික මුදවා ගැනීමේ යාන්ත්‍රණයන් (rescue mechanisms) ඇසුරෙන් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න.

(ලකුණු 25)

2. බොහෝ දියුණු නෛතික පද්ධතීන් සංගමික නෛතික පුද්ගලභාවය හඳුනා ගන්නා අතර එහි තාර්කික අනුමිතීන් (logical implications) ආශ්‍රිත සීමාවන්ද පිළිගනී. සිවිල් නීති අධිකරණ පාත්‍රතාවයන්හි ව්‍යාතිරේඛයන්ගේ අධිකරණමය පදනම වනුයේ සාමාන්‍යයෙන් අයිතිවාසිකම් අවභාවිතා කිරීමේ සංකල්පයයි. ඉංග්‍රීසි නීතියේ මේ ආකාරයේ පොදු මූලධර්මයක් නොමැත. නමුත් එම ප්‍රතිඵලයම සාක්ෂාත් කර ගන්නාවූ විවිධාකාර නිශ්චිත මූලධර්මයන් ඊට ඇත...."

Per Lord Sumption, Prest v Petrodel Resources Limited and others [2013] UKSC 34

ඉංග්‍රීසි නීතිය යටතේ සාංගමික නෛතික පුද්ගලභාවය සීමා කරන හෝ නොසලකාලන නිශ්චිත මූලධර්මයන් විවේචනාත්මකව විග්‍රහ කරන්න. ඔබේ පිළිතුර විනිශ්චිත තීන්දු සහ ප්‍රායෝගික උදාහරණ මගින් සනාථ කළ යුතුය.

(ලකුණු 25)

3. (Creo360 (Pvt) Ltd) (Creo) සතුව Brightstar Ltd සමාගමෙහි කොටස් 65% ක් පවතින අතර කොටස් වලින් 25% ක් රාම් ප්‍රනාන්දු සතු වන අතර ඉතිරි කොටස් 10% සමානව සුනිල් සහ ඉන්ද්‍රන් සතු වේ. සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය දක්වන්නේ 50% කට වඩා වැඩි ඡන්ද අයිතියක් ඇති ඕනෑම කොටස් හිමියෙකු/කොටස් හිමියන් විසින් අධ්‍යක්ෂවරුන් පත් කළ යුතු බවයි. සමාගම සිය කොටස් හිමියන් වෙත ලාභාංශ බෙදා හැරීම සඳහා අනිසි ලෙස පෙළඹවූ බවට රාම් ප්‍රනාන්දු සැක කරයි. ඊට හේතු වනුයේ සමාගම විසින් එම ලාභාංශ ලබා දෙන (Creo) දැඩි මූල්‍ය අබර්දයකට ලක්ව පැවති බවට වන කටකතා වේ. වෙළඳපල වටිනාකමට වඩා අධික මිලකට, බැදීම්වලට යටත් (Creo) සතු ව්‍යාපාර ගොඩනැගිල්ල මිලදී ගැනීම සඳහා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය (Creo) සමඟ විකුණුම් එකඟත්වයකට (sale agreement) එළඹ ඇති බව සුනිල් සහ ඉන්ද්‍රන් සොයා ගනී. තවද, සමාගම සැමවිටම එහි ප්‍රධාන විධායක නිලධාරියාගේ උපදෙස් පිළිපදින බව සහ (Creo) ඔහුගේ බිරිඳ සහ පුතුන් දෙදෙනා සතු බවත් ඔවුන් සොයා ගනී.

අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ විනිශ්චිත තීන්දු ඇසුරින් පාශර්වයන් වෙත පවත්නා ප්‍රතිකර්ම සාකච්ඡා කරන්න.

(ලකුණු 25)

4. "සාංගමික යහපාලනය යනු සියලුම සම්බන්ධිත පාර්ශවකරුවන් (stakeholders) සඳහා උපරිම වටිනාකමක් ලබා දෙන අයුරින් සාංගමික සම්පත් වෙන් කිරීම අරමුණු කරගත් ක්‍රියාවලියකි. එසේම විනිවිදභාවය (transparency) ඇතුළත් බව (inclusivity), සාධාරණත්වය (equity) සහ වගකීම (responsibility) පිළිබඳ ඔවුන්ගේ තීරණ විනිශ්චය කිරීමෙන් ඒවා මෙහෙයවන්නන් වගකීමට ලක් කරයි. එය සමාගමක් මෙහෙයවන, පරිපාලනය කරන හෝ පාලනය කෙරෙහි බලපාන ක්‍රියාවලීන්, පරිචයන්, ප්‍රතිපත්ති, නීති සහ ආයතන සමූහයකි."

ශ්‍රී ලංකාවේ සමාගම් නීතිය ආශ්‍රයෙන් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විග්‍රහ කරන්න.

(ලකුණු 25)

5. නිමල් ඛනිජ නිධි ආශ්‍රිත ව්‍යාපාරයක නිරත විය. 2017, ජනවාරි මාසයේදී ඔහු රුපියල් මිලියන 50 කට මිනිරන් පතලක් මිලදී ගත්තේය. නිමල්, ඔහුගේ මිතුරා වන බිමල් සමඟ එම ව්‍යාපාරයම පවත්වාගෙන යාම සඳහා සමාගමක් පිහිටුවීමට තීරණය කළේය. 2018 ජනවාරි මාසයේදී යෝජිත සමාගම Raini Private Limited යන නමින් නිසි ලෙස සංස්ථාගත වූ අතර නිමල් සහ බිමල් එහි ආරම්භක අධ්‍යක්ෂවරු වූහ. 2018 මාර්තු මාසයේදී නිමල් ඔහු සතුවූ මිනිරන් පතල රුපියල් මිලියන 60 ක මුදලකට (Raini) වෙත විකිණීමට ඒ සමඟින් ගිවිසුමකට එළඹුණි. විකිණීම ක්‍රියාත්මක වූ අතර, අපනයන සිදු කිරීම සඳහා මහජනතාව වෙත කොටස් අපර්ණය කරමින් (Raini) විසින් සංස්ථා ප්‍රකාශය නිකුත් කරනු ලැබිණි. සමාගම මිනිරන් පතල වාසිදායක මිලකට ලබා ගත් බවට වන අධ්‍යක්ෂවරුන්ගේ මතය සංස්ථා ප්‍රකාශයෙහි ප්‍රකාශ කොට තිබුණි. මිනිරන් පතලෙහි වටිනාකම හේතුවෙන් සමාගම ඉක්මනින් අධික ලාභ ඉපයීම පිළිබඳ විශ්වාසය ප්‍රකාශිත සුප්‍රසිද්ධ ඛනිජ විද්‍යාඥයෙකු වන සනුක මහතාගේ ප්‍රකාශයක් ද එහි අඩංගු විය. මහජන නිකුතුව අධි දායකත්වයක් (oversubscribed) ලබා ගත් අතර සමාගම මුලින් ලාභදායී ලෙස සිය ව්‍යාපාරය කරගෙන ගියේය. ඉන් අනතුරුව ස්වාභාවික මිනිරන්වල වෙළඳපල මිල අනපේක්ෂිත ලෙස පහත වැටීම නිසා එහි ප්‍රතිඵලයක් ලෙස සමාගමේ කොටස් මිල පහත වැටිණි. සමාගමට පාඩු සිදු වූ අතර සමාගම විසින් පතල ඉතා අධික මිලකට මිල දී ගත් බව කොටස්කරුවන් පසුව දැනගත් අතර සමාගමට අයත් මිනිරන් නිධිය ගුණාත්මක බවින් අඩු බව නව විද්‍යාත්මක පර්යේෂණයකින් අනාවරණය විය.

2007 අංක 7 දරණ සමාගම් පනතේ ප්‍රතිපාදන සහ අදාළ වන්නාවූ පොදු නීතියේ මූලධර්ම යටතේ නිමල් සහ බිමල්ගේ වගකීම සාකච්ඡා කරන්න.

(ලකුණු 25)

6. අරුල්, භානු සහ ඩේවිඩ් පාසල් ළමුන්ට නිල ඇඳුම් සැපයීමේ ව්‍යාපාරයක නියැලීම සඳහා Top Attires නමින් හවුල් ව්‍යාපාරයක් පිහිටුවා ගත්හ. හවුල් ව්‍යාපාරය සඳහා සුදුසු ස්ථානයක් සොයා ගන්නා ලෙස අරුල්ගෙන් ඉල්ලා සිටි අතර ඔහු සාධාරණ මිලකට ස්ථානයක් සොයා ගත්තේය. කෙසේ වෙතත්, අරුල් එම ගනුදෙනුව මඟින් තමා උපයාගත් කොමිස් මුදල අනාවරණය නොකළේය. වෙනත් දේ අතර, Top Attires හි හවුල්ව්‍යාපාර ගිවිසුමෙහි දැක්වූයේ ව්‍යාපාරය වෙත භාණ්ඩ මිලදී ගැනීමට භානුට බලය ඇති බවත් නමුත් අනෙක් හවුල් ව්‍යාපාරකරුවන්ගේ අනුමැතියකින් තොරව රුපියල් මිලියනය

ඉක්මවන කිසිවක් ඇය විසින් මිලදී නොගත යුතු බවත්ය. එවැනි අනුමැතියකින් තොරව, භානු Modern Fabric Ltd වෙතින් රුපියල් මිලියන 2 ක් ඉක්මවූ වටිනාකමකින් යුතු නිළ ඇඳුම් රෙදි මිලදී ගත්තාය.

Top Attires හි මුදල් ප්‍රවාහ ගැටළු කිහිපයක් ඇති බව පෙනී ගිය හෙයින්, එය නලින් වෙතින් මුදල් ණයට ලබා ගත් අතර Top Attires ඉපයූ ලාභයෙන් ප්‍රතිශතයක් මත පොලිය සමඟ ණය ඔහු වෙත ආපසු ගෙවන ලදී. පසුව නලින් දැක්වූයේ තමා Top Attires හි හවුල්කරුවෙකු බවට පත්ව ඇති බවයි. ඩේවිඩ් තම සහෝදරයා වන ස්ටැන්ලි හවුල්කරුවෙකු ලෙස එක් කර ගැනීමට අදහස් කළ නමුත් ස්ටැන්ලි ජනප්‍රිය නොවන ව්‍යාපාරිකයෙකු බැවින් අනෙක් හවුල්කරුවන් ඊට විරුද්ධ විය. පසුව, අරුල් සහ භානු සොයා ගත්තේ ඩේවිඩ් අයහපත් සදාචාරත්වයකින් යුත් අයෙකු බවයි. එබැවින් ඩේවිඩ්ව හවුල්ව්‍යාපාරයෙන් නෙරපා හැරීමට ඔවුන්ට අවශ්‍ය විය.

ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ විනිශ්චිත තීන්දු ඇසුරින් ඉහත සිද්ධියේදී පැන නැගී ඇති නෛතික ගැටළු සාකච්ඡා කරන්න.

(ලකුණු 25)

7. ටිරාන් සහ හේමාල් පරිගණක නිෂ්පාදනය කරන Speed Codes Ltd හි අධ්‍යක්ෂවරු පස් දෙනෙක් ගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරු වෙති. කළමනාකාර අධ්‍යක්ෂවරයා වන ටිරාන්, සමාගම වෙනුවෙන් Comtop Ltd වෙත පරිගණක සැපයීම සඳහා ගිවිසුමට එළඹෙයි. ටිරාන් හට Comtop Ltd වෙතින් සැලකිය යුතු කොමිස් මුදලක් ලැබෙන අතර ඔහු එය අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් සඟවයි. අනෙක් අධ්‍යක්ෂවරුන්ගේ අනුදැනීමෙන් තොරව හේමාල් පරිගණක හා ලැප්ටොප් පරිගණක අලෙවි කිරීම සඳහා තමන්ගේම සමාගමක් පවත්වාගෙන යයි. සමාගම, රු. මිලියන 75 ක් වටිනා සිය ව්‍යාපාරික දේපලක් රු. මිලියන 70 කට හේමාල්ගේ පියා වෙත විකුණයි.

COVID -19 සිදුවීමෙන් පසුව සමාගම මූල්‍ය දුෂ්කරතාවන්ට මුහුණ දෙයි. සේවකයින් වෙත වැටුප් ගෙවා නොමැති අතර ණය හිමියන් වෙත ගෙවිය යුතු අරමුදල් හි හිඟයක්ද පවතී. අනෙක් අධ්‍යක්ෂවරුන් සමාගම ගණන් බේරා වසා දැමිය යුතු බව යෝජනා කරන අතර ටිරාන්, අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් නොමැතිව බැංකුවකින් ණයක් ලබා ගනී. සමාගම පවත්වාගෙන යාම සඳහා අරමුදල් සැපයීමට සමාගමට අයත් ගොඩනැගිලි වලින් එකක්

මිලදී ගැනීමට තමා කැමැත්තෙන් සිටින බවත් ටිරාන් යෝජනා කරයි. අනතුරුව, රු. මිලියන 50 ක් වටිනා ගොඩනැගිල්ලක් රු. මිලියන 40 ක මුදලකට ටිරාන් වෙත විකුණයි. අධ්‍යක්ෂ මණ්ඩලය අඩු මිල පිළිබඳව සැලකිලිමත් වුවද, සමාගමේ මූල්‍ය තත්ත්වය වැඩිදියුණු කිරීමේ ප්‍රයත්නයක් ලෙස ඔවුහු එය පිළිගනී.

සුදුසු අධිකාරීන් ආශ්‍රයෙන් ඉහත සිදුවීමේදී අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් තනි තනිව සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම ලෙස විනිශ්චය කරන්න.

(ලකුණු 25)

************